# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| මගේ අංකය / எனது இல / My Ref. | CSS/7/1/3 | ඔබේ අංකය / உனது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2019.05. 16 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 02 – 2019

ආණ්ඩුකාර ලේකම්/ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් / පළාත් සභා ලේකම්,

පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් / පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**මාණ්ඩලික නිලධාරීන්ගේ ඉන්ධන දීමනාව සංශෝධනය කිරීම හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ පරිදි සංග්‍රහ දීමනාව ලබා දීම.**

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් 2019.03.27 දින නිකුත් කර ඇති ස්වදේශ කටයුතු චක්‍රලේඛ අංක 08/2019 දරණ චක්‍රලේඛය මඟින් දිස්ත්‍රික් පරිපාලනයේ සහ ප්‍රාදේශීය පරිපාලනයේ සේවයේ නියුතු මාණ්ඩලික නිලධාරීන්ට දැනටමත් ගෙවනු ලබන සංග්‍රහ දීමනාව සහ ඉන්ධන දීමනාව යෝජිත වියදම් සීමාව තුළ බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත සංශෝධනය කර ඇත.

එම චක්‍රලේඛය මඟින් සංශෝධිත ඉන්ධන දීමනාව සහ සංග්‍රහ දීමනාව 2019 වර්ෂයේ මුදල් ප්‍රකාශ මඟින් වෙන් කර ඇති ප්‍රතිපාදන සීමාව තුළ කළමනාකරණය කර ගැනීමට යටත්ව ,පහත සඳහන් පරිදි 2019.05.01 දින සිට දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/6/1/19 හා 2019.05.13 දිනැති ලිපිය මඟින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

**ඉන්ධන දීමනාව**

| තනතුර | දැනට ගෙවනු ලබන ප්‍රමාණය | යෝජිත ප්‍රමාණය |
|---|---|---|
| ප්‍රධාන ලේකම් | ලීටර් 225 | ලීටර් 300 |
| ආණ්ඩුකාර ලේකම්/සභා ලේකම්/රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්/ අමාත්‍යාංශ ලේකම් / නියෝජ්‍ය ප්‍රධාන ලේකම් | ලීටර් 170 | ලීටර් 250 |
| දෙපාර්තමේන්තු ප්‍රධානීන් | ලීටර් 140 | ලීටර් 175 |

<u>සංග්‍රහ දීමනාව (ප්‍රතිපූරණය කිරීමේ පදනම මත )</u>

| | |
|---|---|
| ප්‍රධාන ලේකම් | - රු. 15,000/- |
| ආණ්ඩුකාර ලේකම්/පළාත් සභා ලේකම්/<br>පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්<br>පළාත් අමාත්‍යාංශ ලේකම් / නියෝජ්‍ය ප්‍රධාන ලේකම් | - රු. 15,000/- |
| දෙපාර්තමේන්තු ප්‍රධානීන් | - රු: 10,000/- |

ආර්.සී.ද සොයිසා,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත

01. සහකාර විගණකාධිපති, දකුණු පළාත - දැ.ගැ.ස.
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ - දැ.ගැ.ස.
03. ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ - දැ.ගැ.ස.
04. අයවැය අධ්‍යක්ෂ - දැ.ගැ.ස.